<u>ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන-ජනාධිපති කාර්යාලය</u>

වයාප්ති යෝජනා ඉදිරිපත් කිරීම- 2019 වර්ෂය

01.ව්‍යාපෘතියේ නම-ප්‍රාදේශීය මට්ටමින් පැළ තවාන් ස්ථාපිත කිරීම.

02.ව්‍යාපෘතිය කරනු ලබන ප්‍රදේශ

දිස්ත්‍රික්කය-ගාල්ල.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -යක්කලමුල්ල.

ගොවිජන සේවා මධ්‍යස්ථානය-යක්කලමුල්ල.

03. ව්‍යාපෘතියේ අවශ්‍යතාවය -

3.1 හැඳින්වීම

ලංකාවේ දැනට වගා කිරීම සඳහා පැල ලබා ගැනීමට ඉල්ලුම්කල විට පැල හිඟයක් පවතින අතර පැල තවාන්වලින් අදාල ඉල්ලීම සැපයිය නොහැකි වී ඇත.මෙම තත්වය මඟ හරවාගෙන යක්කලමුල්ල කොට්ඨාසයේ දේශගුණික තත්වයන් හා අනෙකුත් සාධක වලට ගැලපෙන පරිදි හඳුනාගත් භූමියක කෙටිකාලීන හා දිගුකාලීන බෝග වලට අදාලව පැල බීජ හා රෝපණ ද්‍රව්‍ය සපයා ගතහැකි මධ්‍යස්ථානයක් වශයෙන් පැල තවානක් සකසා ගැනීමට අපේක්ෂිතය.මේ සඳහා තෙල්ලඹුර පහළ ග්‍රාම නිලධාරී වසම තෝරාගෙන ඇත.

3.2 ව්‍යාපෘතියේ අරමුණු

- ❖ කොට්ඨාසයේ පැළ අවශ්‍යතාවය කොට්ඨාසය තුලින්ම සපුරා ගැනීම.
- ❖ තත්වයෙන් උසස් පැළ නිෂ්පාදනය කිරීම.
- ❖ පැල තවාන සඳහා හොඳ වෙළඳපොලක් සපයා ගැනීම.
- ❖ අදාල ව්‍යවසායකයාගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම.

3.3 ව්‍යාපෘතිය මඟින් ආමන්ත්‍රණය කරනු ලබන ගැටළුව

යක්කලමුල්ල කොට්ඨාසයේ දේශගුණික හා අනෙකුත් සාධකවලට ගැලපෙන පරිදි කෙටිකාලීන හා දිගු කාලීන බෝගවලට අදාලව පැල බීජ හා රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාවය කොට්ඨාසයෙන් සපුරාගත නොහැකි වීම හා ප්‍රමිතියෙන් යුතු පැල සපයාගත නොහැකි වීම.

3.4 ගැටළුව නිරාකරණය කර ගැනීම පිණිස ව්‍යාපෘතිය මඟින් යෝජිත වැඩපිළිවෙල

යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුල පැල තවාන් පවත්වාගෙන යන ව්‍යවසායකයින් අතරින් දැනට සාර්ථකව පැල තවාන් කරගෙන යන ව්‍යවසායිකාවකට මෙම වැඩසටහන යටතේ 50% රජයේ දායකත්වය මත ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂිතය.මෙහිදී අදාල වසම භාර ආර්ථික සංවර්ධන නිලධාරී හරහා කෘෂිකර්ම උපදේශකගේ නිර්දේශයෙන් ව්‍යවසායිකාව තෝරා ගනු ලබයි. එසේ තෝරා ගනු ලබන ප්‍රතිලාභියා හට ආවරණ දැලක් හා ගෘහය සෑදීමට අවශ්‍ය යකඩ බට ලබා දීමට නියමිතය. එසේම මෙම ව්‍යවසායිකාවට කෘෂිකර්ම උපදේශක මඟින් පැල තවාන් පිළිබඳ තාක්ෂණික දැනුම ලබා දීමට නියමිතය.

3.5 ප්‍රතිලාභියාගේ විස්තර

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ,තෙල්ලඹුර පහළ ග්‍රාම නිලධාරී වසමේ ව්‍යවසායිකාවට මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබා දීමට නියමිතය.ඇය දැනට පවත්වාගෙන යන පැල තවානේ එළවළු,පළතුරු,මල්, ඖෂධ,ආදීපැල නිෂ්පාදනය කරනු ලබයි.මෙහිදී බද්ධ පැල නිෂ්පාදනයද කරන අතර පැල තවානට අමතරව ඇයගේ නිවසේද බද්ධ පැල නිෂ්පාදනය සිදු කරයි.

4.ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ

- ❖ කොට්ඨාසයේ පැළ අව්‍යතාවය කොට්ඨාසය තුලින්ම සපුරා ගැනීමට අවස්ථාව ලබා ගැනීම.
- ❖ තත්වයෙන් උසස් පැළ නිෂ්පාදනයක් කොට්ඨාසය තුලින්ම සපුරා ගැනීම.
- ❖ කොට්ඨාසය තුලපැල තවාන් සඳහා හොඳ වෙළඳපොලක් සපයා ගැනීම.
- ❖ අදාල ව්‍යවසායකයාගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම.

5. වියදම් ඇස්තමේන්තුව

| අනු අංකය | ක්‍රියාකාරකම | ඒකක මිල(රු) | ප්‍රමාණය | ඇස්තමේන්තුව | |
|---|---|---|---|---|---|
| | | | | ගොවි දායකත්වය | රජයේ දායකත්වය |
| | උපකරණ හා අමු ද්‍රව්‍ය<br>❖ සෙවන දැල්<br>❖ බාර්(අහල)<br>❖ සිමෙන්ති<br>❖ වැලි කියුබ්<br>❖ කොන්ක්‍රීට් ගල් කියුබ්<br>❖ සැකිල්ල සඳහාදැල් රඳවන (clips)<br>❖ පේන්ට් (ඇන්ටිකොරොස්)<br>❖ ටිනර් | <br>160.00<br>2900.00<br>950.00<br>15000.00<br>6500.00<br>60.00<br><br>890.00<br><br>280.00 | <br>ව.මී.150<br>20<br>10<br>1<br>1<br><br>100<br>ලීටර් 3<br><br>ලීටර් 2 | <br>-<br>-<br>රු .9500.00<br>රු.15000.00<br>රු. 6500.00<br><br>රු. 6,000.00<br>රු. 2670.00<br><br>රු. 560.00 | <br>රු.24,000.00<br>රු.58,000.00<br>-<br>-<br>-<br><br>-<br>-<br><br>- |
| 02. | වැල්ඩින් කටයුතු සඳහා(අත්තම් කුලීය) | 2500.00 | 10 | රු25000.00 | - |
| 03. | දැල සකස් කිරීම සඳහා බාස් කුලීය | 1500.00 | 2 | රු.3000.00 | - |
| 04. | ගෘහය සෑදීම සඳහා බාස් කුලීය | 2500.00 | 5 | රු.12500.00 | - |
| 05. | සහායක බාස් කුලීය | 1500.00 | 5 | රු. 7500.00 | |
| 06. | අමතර වියදම් | | | රු .7500.00 | |
| 07. | වියදම | - | - | - | රු.82,000.00 |
| 08. | පරිපාලන වියදම් | | | - | රු. 5457.63 |
| 09. | මුළු වියදම | | | රු.95730.00 | රු .87457.63 |
| 10. | දායකත්වයේ ප්‍රතිශතය | | | 52.62 % | 47.74 % |

සංවර්ධන නිලධාරී(කෘෂිකර්ම) නිර්දේශය(නිල මුද්‍රාව)

සකස් කලේ